කලාප අධ්‍යාපන කාර්යාලය -කටුගස්තොට
வலயக்கல்வி காரியாலயம்.
கட்டுகஸ்தோட்டை
**Zonal Education Office-Katugasthota**

පළමු වාර අනාවරණ පරීක්ෂණය - 2022

| 9 ශ්‍රේණිය | ගණිතය | 32 | S | I,II |
|---|---|---|---|---|

පැය දෙකයි

## I පත්‍රය

ප්‍රශ්න **සියල්ලටම** පිළිතුරු සපයන්න. .

(1). 3, 7, 11,.....යන රටාවේ 9 වැනි පදයේ අගය කීයද?


mathematica.lk

(2). 27 ද්වීමය සංඛ්‍යාවක් ලෙස ලියන්න.

(3).$(a+4)\ (a-2)$ ප්‍රසාරණය කර ත්‍රිපද ප්‍රකාශනයක් ලෙස ලියන්න.

(4). රු. 90.00 කට ගත් මැටි භාණ්ඩයක් විකිණීමෙන් වෙළෙන්දෙක් රු.20.00 ක ලාභයක් අපේක්ෂා කරයි. භාණ්ඩය විකිණිය යුතු මිල කීයද?

(5).AB හා CD රේඛා සමාන්තර වේද? ඔබේ පිළිතුරට හේතුව ලියන්න.




(6). $\frac{2}{3}+\frac{1}{6}$ සුළු කරන්න.


(7). $a^2+4a+2a+8$ හි සාධක සොයන්න.

(8). $x=3$ හා $y=\frac{1}{2}$ නම් $3x+2y$ හි අගය සොයන්න.

(9). රු. 750 ලෙස මිල ලකුණු කර ඇති පොතක් සාහිත්‍ය මාසයේ දී විකුණනු ලබන්නේ 20% ක වට්ටමක් සහිතවය. පොතේ විකුණුම් මිල කීයද?


(10). $3l$ ක ධාරිතාවක් සහිත බඳුනක් සම්පූර්ණයෙන් පිරවීම සඳහා 500 ml ක ධාරිතාවකින් යුතු ජෝගුවකින් අවම වශයෙන් කී වතාවක් ජලය වත් කළ යුතුද?

(11). දී ඇති රූපයේ BD=EC නම් BE=DC බව පෙන්වන්න.




(12). තැරැව්කරුවකු යතුරු පැදියක් විකිණීම සඳහා 8% ක තැරැව් ගාස්තුවක් අය කරයි. යතුරු පැදියේ විකුණුම් මිල රු.7500 ක් නම් තැරුව් ගාස්තු කීයද?


(13). 3n + 2 මගින් පොදු පදය දැක්වෙන සංඛ්‍යා රටාවේ මුල් පද දෙක ලියන්න.

(14). 



රූපයේ දී ඇති දත්ත අනුව $R\hat{C}D$ හි අගය කීයද?

(15). $\frac{1}{2}+\frac{3}{4}$ න් $\frac{1}{3}$ සුළු කරන්න.

(16). මෙහි සමචතුරස්‍රයේ පැත්තක දිග ඒකක b වන අතර QR ඒකක 3 ක්ද, WT ඒකක 2 ක්ද වේ. PRST සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය සඳහා ප්‍රකාශනයක් ලියන්න.(සුළු කිරීම් අවශ්‍ය නොවේ)




(17). AB හා CD සරල රේඛා E හි දී ඡේදනය වේ. $x^o, y^o$ හි අගය සොයන්න.




(18). P = Q ද $a \neq 0$ ද නම් සුදුසු ලකුණ යොදන්න. $(<,=,\neq,>)$

$$\frac{P}{a} \ldots\ldots \frac{Q}{a}$$

(19) 450 $cm^3$ මිලිලීටර කීයද?

(20) විසඳන්න: $2x + 5 = 17$

## II පත්‍රය

ප්‍රශ්න **5 කට පමණක්** පිළිතුරු සපයන්න.

01. 7, 13, 19, 25, .... මෙම සංඛ්‍යා රටාවේ

mathematica.lk

(i) අනුයාත පද 2ක් අතර වෙනස සොයන්න.

(ii). සාධාරණ පදය සොයන්න.

(iii). සාධාරණ පදය ඇසුරෙන් එකොළොස් වන පදය සොයන්න.

(iv). 121 වන්නේ කී වෙනි පදයද ?

(v). (n+1) වන පදය n ඇසුරෙන් සොයන්න.

02. (i). $11001_{දෙක}$ ගණක රාමුවක නිරූපණය කරන්න.

(ii). $12_{දහය}$ ද්වීමය සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

(iii). $101_{දෙක}$ දශමය සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

(iv). සුළු කරන්න

*a.* $1010_{දෙක} + 101_{දෙක}$

mathematica.lk

*b.* $101_{දෙක} - 10_{දෙක}$

03. (a) (i). $\frac{19}{8}$ මිශ්‍ර සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

(ii). $3\frac{1}{4}$ විෂම භාගයක් ලෙස දක්වන්න.

(iii). සුළු කරන්න: $\left(4\frac{1}{5}+1\frac{2}{3}\right)\div 2\frac{1}{5}$

(b). සම්පූර්ණයෙන් ජලය පිරී ඇති ටැංකියකින් $\frac{1}{3}$ ක් වගාවටද $\frac{1}{4}$ ක් නෑමටද, යොදා ගන්නා ලදී. පාවිච්චි කළ මුළු ජල ප්‍රමාණය භාගයක් ලෙස දක්වන්න.

04. *a.* $y\,(y+3) + 2\,(y+5)$ වරහන් ඉවත් කර සුළු කරන්න.

b. සාධක සොයන්න.

i. $3a + 9a^2$

mathematica.lk

ii. $x^2 + 5x + 6$

iii. $x^2 - 9y^2$

*c.* $a = 2,\ b = 3$ විට $a^2 - 5ab + b^2$ හි අගය සොයන්න.

05. (a). වෙළෙන්දෙක් රු. 40 බැගින් බිත්තර 100ක් මිලට ගත් අතර ප්‍රවාහනයේදී ඉන් බිත්තර 10ක් කැඩී යාම නිසා විකිණීමට නොහැකි තත්වයකට පත් වී තිබුණි. ඉතිරි බිත්තර 1ක් රු. 50 බැගින් විකුණන ලද්දේ නම්,

i. ඔහුට ලැබුණේ ලාභයක්ද, අලාභයක්ද යන්න ලියා දක්වන්න.

ii. එය ගණනය කරන්න.

iii. එම ලාභයේ හෝ අලාභයේ ප්‍රතිශතය ගණනය කරන්න.

(b). රු. 60000ක් වටිනා රූපවාහිනී යන්ත්‍රයක් අත්පිට මුදලට විකිණීමේදී 10%ක වට්ටමක් ලබා දෙයි.

i. හිමි වන වට්ටම් මුදල ගණනය කරන්න.

mathematica.lk

ii. රූපවාහිනී යන්ත්‍රය සඳහා ගෙවිය යුතු මුදල සොයන්න.

06 . දිග 20 cm, පළල 15 cm, සහ උස 12 cm වන ඝනකාභයක හැඩැති වීදුරු භාජනයක 10 cm උසට සිසිල් බීම පුරවා ඇත.

i. වීදුරු භාජනයේ ධාරිතාව ඝන සෙන්ටිමීටර වලින් සොයන්න.

ii. වීදුරු භාජනයේ ධාරිතාව ලීටර වලින් කොපමණද?

iii. වීදුරු භාජනයේ ඇති සිසිල් බීම පරිමාව ඝන සෙන්ටිමීටර වලින් සොයන්න.

iv . වීදුරු භාජනයේ ඇති සිසිල් බීම සියල්ලම ධාරිතාව 100 ml වන සමාන බෝතල්වලට පිරවිය යුතු නම් අවශ්‍ය වන බෝතල් ගණන සොයන්න.

mathematica.lk

PARCEL NO

# LOL.lk BookStore

# විභාග ඉලක්ක
## පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION · pesuru Prakashana Private Ltd. · Akura Pilot · සමනල දැනුම · සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**